**ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල - 2020**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**--------------------------------**

ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2020 දෙසැම්බර් 31 දිනට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණු අවධාරණය කිරීම**
**----------------------------**

මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 04 හා 05 මගින් දැක්වෙන අඛණ්ඩ පැවැත්ම වෙත අවධානය යොමු කරන අතර එමඟින් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පවත්වා ගෙන යාමේ හැකියාව පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවත් ඒ හේතුවෙන් අරමුදලේ ආදායම් උපලබ්ධි කර ගැනීම හා වගකීම් නිදහස් කිරීම සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ සිදු කර ගත නොහැකි බවත් දක්වා තිබුණි. එසේම, මෙම අරමුදල අහෝසි කිරීම සඳහා කඩිනමින් ඉදිරියේදී අමාත්‍ය මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත බවත් ඒ තුළින් අරමුදල පිහිටුවීම එහි ගනුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය මගින් භාර ගැනීම, ඇවර කිරීම යනාදිය සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිත බවත් අරමුදලේ ලේකම්වරයා වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් මා වෙත දන්වා තිබුණි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති බව කළමනාකාරීත්වය විසින් තීරණය කිරීම හේතුවෙන්, අරමුදල විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රාග්ධන දායකත්වය වෙනුවෙන් ආයෝජනය කර ඇති රු. 48,000,000,000 වටිනාකම ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර තිබුණද ප්‍රායෝගිකව එය වාර්තා කරන කාලපරිච්ඡේදයෙන් පසුව මාස දොළහක් තුළදී උපලබ්ධි කළ හැක්කේ කෙසේද යන්න විගණනයේදී ප්‍රශ්නගත කරුණක් විය. | මෙම අරමුදල අහෝසි කිරීම සඳහා කඩිනමින් ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට යොජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත අතර, එයට අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2022 අයවැය තුලින් අරමුදල පිහිටුවීම, එහි ගණුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහාභාණ්ඩාගාරය මගින් භාර ගැනීම, ඇවර කිරීම යනාදිය සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | විධිමත් අනුමැතියක් මත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගතයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ඒ මත පදනම්ව දැනට ගිණුම් ප්‍රකාශවල සියලු වගකීම් ජංගම වගකීම් ලෙස වර්ග කර නිවැරදි කර ඇත. | |
| (ආ) | ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බිල්පත් නිකුත් කර මෙම අරමුදලට ලබාදුන් රු. 47,472,450,000 වටිනාකමින්, තවදුරටත් ගෙවීමට ඉතිරිව ඇති රු. 26,673,196,758 ක මුදල ගෙවීම සඳහා 2020 දෙසැම්බර් 31 දිනට අරමුදල සතුව පැවති මුදල් ශේෂය රු. 378,108,419 ක පමණක් විය. ඒ අනුව අරමුදලට අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම හේතුවෙන් මූල්‍යමය බැඳීම නිදහස් කිරීමට අරමුදල සතුව ප්‍රමාණවත් තරම් මුදල් නොතිබීම හේතුවෙන් අරමුදලෙහි නුබුන්වත් බව පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් පැන නැඟී තිබුණි. | 2021 ජනවාරි 09 දිනෙන් පසු අධිභාර ලැබීම් නොමැත. ඒ දක්වා බැංකු ශේෂය යාවත්කාලීන කර ඇති අතර එම ශේෂය රු. 1,107,728,128.74 ක් වේ. | විධිමත් අනුමැතියක් මත මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වගකීම් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගතයුතුය. |
| (ඇ) | 2020 අප්‍රේල් 02 දිනැති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 03 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අරමුදලේ ලේකම් වන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සිදු කළ යුතු විය. කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා හා තවත් එක් සාමාජිකයෙකු සහතික කොට මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවද ඉහත කී ලේකම්වරයාගේ අත්සනින් යුතුව පමණක් මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණි. | එකඟ වෙමි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම විධිමත් කළයුතුය. |
| (ඈ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අවසානයේ වගවීමේ ප්‍රකාශය ඇතුළත් කර නොතිබුණි. | සියළු ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම් සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම විධිමත් කළයුතුය. |

**1.6.2 අධිකාරී බලය නොලත් ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව ප්‍රකාරව සියලුම අයබදු, තීරුබදු, වරිපනම් හා ගාස්තු යන මාර්ගවලින් ලැබෙන ආදායම්ද, නියමිත කාර්යය සඳහා වෙන් කරනු නොලැබූ ජනරජය සතු සෙසු සියලුම ආදායම් සහ ලැබීම්ද ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතුය. එසේ වුවද 2020 මාර්තු 14 දින සිට ඉන්ධන මිල මත අයකර ඇති අධිභාරය මත වූ ආදායම, එසේ බැර නොකර ව්‍යවස්ථාපිත නොවන ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලට බැර කර තිබුණි. | ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ඒකාබද්ධ අරමුදලින් පරිබාහිරව පිහිට වූ අරමුදලකි. ආනයනය කළ එක් එක් ඉන්ධන වර්ගය සහ ලීටර ප්‍රමාණය මත පදනම්ව වරින්වර සංශෝධනයන්ට යටත් අනුප්‍රමාණයන් මත ප්‍රකාශිත ගැසට් නිවේදන අනුව ශ්‍රී ලංකා රේගුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිය මඟින් ස්වයංක්‍රීයව ගණනය කර ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදලේ බැංකු ගිණුම වෙත ප්‍රේෂණය කෙරේ. | අරමුදල පාර්ලිමේන්තු පනතක් තුලින් විධිමත්ව පිහිටුවීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 ව්‍යවස්ථාව සහ 2020 අගෝස්තු 29 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | විසර්ජන පනතට අනනුකූලව ආදායම් රැස් කිරීම හා වියදම් දැරීම 2020 මාර්තු මස 18 දින ආරම්භ කර තිබූ මෙම අරමුදල සඳහා වර්ෂයක් ඇතුළත ලබාගත යුතු පාර්ලිමේන්තු අනුමැතිය විගණිත දිනය වූ 2021 සැප්තැම්බර් 06 දින වන විටත් ලබාගෙන නොතිබුණි. | එකඟ වෙමි. කෙසේ වෙතත් මෙම අරමුදල අහෝසි කිරීම සඳහා කඩිනමින් ඉදිරියේදී කැබිනට් මණ්ඩලයට යෝජනාවක් ඉදිරිපත් කිරීමට යෝජිත අතර, එයට අනුමැතිය ලබා ගැනීමෙන් පසු රා. මු. චක්‍රලේඛ 01/ 2020 පරිදි 2022 අයවැය තුලින් අරමුදල පිහිටුවීම, එහි ගණුදෙනු හා වගකීම් පියවීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය මගින් භාර ගැනීම, ඇවර කිරීම යනාදිය ඇතුළත්ව අරමුදලේ සියලු කටයුතු සම්බන්ධව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට නියමිතය. | අදාළ ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන ප්‍රකාරව කටයුතු කළයුතුවීම. |

## 1.8 ආයෝජන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| මිල ස්ථායීකරණ අරමුදලක් ඇතිකිරීමේ අපේක්ෂිත අරමුණ විය යුත්තේ මිල වැඩිවීමේදී හා අඩුවීමේදී සිදුවන මිල උච්චාවචනයන් සමනය කර දේශිය වෙළෙඳපලේ ඉන්ධන සම්බන්ධයෙන් ස්ථාවර මිලක් පවත්වා ගැනීම වුවද මෙම අතිරික්තය දේශීය මිල ස්ථායිව පවත්වා ගෙන යෑම සඳහා ද්‍රවශීල වත්කමක් ලෙස පවත්වාගෙන යාමක් පිළිබඳව අමාත්‍ය මණ්ඩල සංදේශයේ හෝ අනුමැතියේ සඳහන් නොවූ අතර එහි වූ අනුමැතිය පරිදිම අරමුදලේ රු. බිලියන 48 ක මුදල්, විදුලිබල මණ්ඩලය වෙත ප්‍රාග්ධන දායකත්වයක් ලෙස ලබාදී එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කෙටිකාලීන ආයෝජන යටතේ දක්වා තිබුණි. | පිළිතුරු සපයා නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

ලෝක වෙළඳපොලේ ඉන්ධන මිල අඩු වී තිබියදී ඉන්ධන ආනයනයේදී ශ්‍රී ලංකා රේගුව විසින් අධිභාරයන් අයකර පැවති මිලටම ඉන්ධන අලෙවි කර 2020 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉන්ධන ස්ථායීකරණ අරමුදල රු. 21,705,914,462 ක ශුද්ධ අධිභාර ආදායමක් උපයාගෙන තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 21,705,911,662 ක අතිරික්තයක් විය.

## 3. ශිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අප්‍රේල් 02 දිනැති අංක 20/0684/204/060 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ඊට අදාළ සමාංක හා 2020 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවේ 02 ඡේදය ප්‍රකාරව, උක්ත අරමුදල කළමනාකරණය සඳහා කමිටුවක් පත්කිරීම හෝ නියෝග නිකුත් කිරීම සිදු කළ යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම විධිමත් කළයුතුවීම. |

## 4. අරමුදල් ස්ථාපිත කිරීම හා ආදායම් රැස් කිරීම

### 4.1 අරමුදලේ මෙහෙයුම් කටයුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම මගින් ඒකාබද්ධ අරමුදලට අරමුදල් ලබාගෙන එමගින් ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල වෙත රු. 47,472,450,000 ක මුදලක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබාදී තිබුණද ඒ සඳහා 2020 වර්ෂයේදී පාර්ලිමේන්තුව වෙතින් විධිමත් ප්‍රතිපාදන සලසාගැනීමක් සිදුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල සඳහා අවශ්‍ය මූලික ප්‍රාග්ධන මුදල අත්තිකාරමක් ලෙස රු. බි. 47.472ක මුදලක් භාණ්ඩාගාර බිල්පත් මගින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රණය හරහා ලබා ගෙන ඇත. එමෙන්ම භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරිම හා නිදහස් කිරීම කරනුයේ ප්‍රධාන ලෙජර් ගිණුම් හරහා වේ. | විධිමත් පරිදි ප්‍රතිපාදන සලසා ගත යුතුවීම. |
| (ආ) | (i) 2020 මාර්තු 11 වන දින වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් භාණ්ඩාගාර ලේකම් මගින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතියට ඉදිරිපත් කළ සටහනට අනුව, 2020 මාර්තු 09 දින වනවිට අන්තර්ජාතික වෙළඳපොලේ බොරතෙල් මිල සියයට 42.5 කින් පහළ බැස ඇති බවත්, එය ඒ වනවිට බැරලයක් එ.ජ. ඩොලර් 34.63 ක් පමණ වන බවත්, 2019 සැප්තැම්බර් මස වනවිට එය එ.ජ. ඩොලර් 59.73 ක් වන බවත් දන්වා තිබුණි. | එකඟ වෙමි. | |

මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කළ ගණනය කිරීම් අනුව, බොරතෙල් මිල පහළ යාම හේතුවෙන් ඉන්ධන ලීටරයක මිල පහත පරිදි පහළයාමක් බලාපොරොත්තු වී තිබුණි.

| | පෙට්‍රල් 92 ඔක්ටේන් | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් | සුපිරි ඩීසල් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| මිල ගැලපුම (ලීටරයකට) (ආසන්න වශයෙන්) | 12 | 15 | 14 | 20 |

(ii) මෙම මිල පහළයාමේ වාසිය, ලබාදී ඇති බදු සහන අයකර ගැනීමෙන් පසු මුළු ප්‍රතිපාදනයම මහජනතාවට ලබාදීම, බදු අයකිරීම ඉහළ නංවා මුළු ප්‍රතිලාභයම රජයේ ආදායමට ලබාගැනීම, ඉන්ධනවල සිල්ලර මිල පහත දැමීම හා ඉන්ධන මිලෙහි වෙනසක් නොකොට ඉන්ධන සැපයුම් ආයතන විසින් අවසාන මාස 05 තුළදී ලබාඇති පාඩුව පියවා ගැනීම ලෙස විකල්ප 04 ක් යටතේ ඇඟයීම් කර තිබුණි.

එකඟ වෙමි.

(iii) කෙසේ වෙතත්, වෙළඳ හා ආයෝජන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සටහනේ (ආ) ඡේදය අනුව ඔටෝ ඩීසල් සඳහා රු. 11 ක් ද, පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා රු. 15 ක් ද, සුපිරි ඩීසල් සඳහා රු. 20 ක්ද වශයෙන් වූ මිල අඩුවීමේ ඉතිරිය සඳහා රේගු ආඥා පනත යටතේ අධිභාරයන් පැනවීම හෝ වෙළඳපොළ මිල අඩුකිරීම සඳහා මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයාගේ අනුමැතිය අපේක්ෂා කර තිබුණි.

එකඟ වෙමි.

(iv) ඒ අනුව, අංක 2166/35 හා 2020 මාර්තු 13 වන දින පළකර ඇති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පහත පරිදි ඉන්ධන හා සම්බන්ධ තීරු බද්ද සමඟ අයකළ යුතු අධිභාරය 2020 මාර්තු 14 දින සිට මාස 02 ක කාල සීමාවක් සඳහා බලපැවැත්වෙන පරිදි නියම කර තිබුණි.

| | පෙට්‍රල් 92 ඔක්ටේන් | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් | සුපිරි ඩීසල් |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| අධිභාරය (ලීටරයකට) | 0 | 15 | 11 | 20 |

එකඟ වෙමි.

(v) පසුව අන්තර්ජාතික වෙළඳපලේ බොරතෙල් මිල උච්චාවචනය වූ අවස්ථාවලදී පහත පරිදි අධිභාර වටිනාකම අති විශේෂ ගැසට් පත්‍ර මඟින් සංශෝධනය කර තිබුණි.

| ගැසට් පත්‍ර අංකය | දිනය | බලපැවැත් වෙන කාලය | පෙට්‍රල් 92 ඔක්ටේන් | පෙට්‍රල් 95 ඔක්ටේන් | ඔටෝ ඩීසල් | සුපිරි ඩීසල් |
|---|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. | රු. |
| 2172/6 | 2020.04.22 | 2020.04.23 දින සිට මාස 02 | 26 | 49 | 24 | 40 |
| 2181/13 | 2020.06.24 | එදින සිට මාස 02 | 0 | 20 | 12 | 30 |
| 2189/57 | 2020.08.23 | 2020.08.24 දින සිට මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2203/1 | 2020.11.23 | 2020.11.24 දින සිට මාස 03 | 0 | 20 | 12 | 30 |
| 2213/7 | 2021.02.01 | 2021.02.02 දින සිට 2021.02.23 දක්වා | 0 | 0 | 0 | 0 |

විගනකවරුන් විසින් කැඳවන ලද්දේ 2020.12.31 දක්වා තොරතුරු පමණි. ඒ දක්වා මෙමෙ දෙපාර්තමේන්තුව සතුව පවතින සියලු තොරතුරු විගණකවරුන් වෙත ලබා දී ඇත. කෙසේ වෙතත් 2021 ජනවාරි 09 දිනෙන් පසු අධිභාර ලැබීම් නොමැත. ඒ දක්වා බැංකු ශේෂය යාවත්කාලීන කර ඇති අතර එම ශේෂය රු. 1,107,728,128.74 ක් වේ.

| | | | |
|---|---|---|---|
| (vi) | අංක 2213/7 හා 2021 පෙබරවාරි මස 01 දින නිකුත් කළ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අංක 2203/1 හා 2020 නොවැම්බර් 23 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත නියමය 2021 පෙබරවාරි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කර තිබුණද, අදාළ අධිභාරය ක්‍රියාත්මක වීම පිළිබඳ තොරතුරු අනාවරණය නොවිය. (2021 පෙබරවාරි 23 දිනෙන් පසු) | පිළිතුරු සපයා නොමැත. | |
| (ඇ) | ප්‍රවර්ථන වර්ෂයේ අගොස්තු, ඔක්තෝබර් සහ දෙසැම්බර් මාස වලදී පිළිවෙලින් රු. 12,000,000,442 ක් , රු. 6,054,992,400 ක් සහ රු. 2,744,260,400 ක් ලෙස එකතුව රු. 20,799,253,242 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සඳහා ඇති බාහිර වගකීම් ගිණුම තුළින් අදාළ භාණ්ඩාගාර බිල්පත් නිදහස් කිරීමට කටයුතු කර තිබුණි. | ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල තීරණ ලබාගැනීමෙන් පසු අදාල වගකීම් මහා භාණ්ඩාගාරයේ වගකීමක් වන අතර ඉන්පසු 100% අදාල වගකිම් පියවීමට කටයුතු කරනු ඇත. | |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල මඟින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති මුදල රු. 26,673,196,758 ක් වුවද එම අගයට අදාළ භාණ්ඩාගාර බිල්පත්වල මුහුණත වටිනාකම රු. 29,200,746,758 ක් විය. ඒ අනුව අදාල භාණ්ඩාගාර බිල්පත් වල වට්ටම් වටිනාකම වන රු. 2,527,550,000 ක් වූ එම වෙනස මෙම ක්‍රියාවලියට අදාලව ඒකාබද්ධ අරමුදලට සිදුවන වැය බරක් ලෙස නිරීක්ෂණය විය. | ඉදිරියේදී අමාත්‍ය මණ්ඩල තීරණ ලබාගැනීමෙන් පසු අදාල වගකීම් මහා භාණ්ඩාගාරයේ වගකීමක් වන අතර ඉන්පසු 100% අදාල වගකිම් පියවීමට කටයුතු කරනු ඇත. | |
| (ඉ) | 2021 ජනවාරි මස 18 දින පැවැත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණයකට අනුව ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල ශක්තිමත් කිරීම සඳහා රුපියල් බිලියන 48 ක අරමුදල් මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස භාණ්ඩාගාරයේ ලේකම් වෙත නියෝග කර තිබුණද විගණිත දින වන විටත් එම නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | රටේ පවතින කොවිඩ් වසංගත තත්වය හා ප්‍රමුඛතා කාර්යයන් මත මෙන්ම භාණ්ඩාගාරයේ පවතින අරමුදල් තත්වය අනුව මෙතෙක් අදාල රු.බි. 48 නිදහස් කර නැත. මෙම අරමුදල අවසන් කිරීමට ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බැවින් මෙම නිදහස් කිරීම කල යුතුද නැද්ද යන්න ඉදිරියේ දී සළකා බැලෙනු ඇත. | අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව අවශ්‍ය ඉදිරි පියවර ගත යුතුවීම. |